# සොෆ්ට්ලොජික් ෆිනෑන්ස් සමාගමේ රු.මිලියන 850 ක හිමිකම් නිකුතුවට අධි දායකත්වයක්

සොෆ්ට්ලොජික් කැපිටල් පීඑල්සී හි අනුබද්ධ සමාගමක් වන සොෆ්ට්ලොජික් ෆිනෑන්ස් පීඑල්සී හි රු. මිලියන 850ක වටිනාකමකින් යුත් කොටස් නිකුතුවට ඉහළ ඉල්ලුමක් ලැබුණු බවත්, එය අධි දායකත්වයක් සමගින් පූර්ණ වශයෙන් නිකුත්කර අවසන් කරන ලද බවත් එම සමාගම නිවේදනය කරයි. මෙම නිකුතුව මගින් එක්රැස් කරගන්නා ලද අරමුදල් සමාගමේ ප්‍රාග්ධන සප්‍රමාණ අවශ්‍යතා සපුරාලීමට මෙන්ම එහි ඩිජිටල්කරණ කටයුතු සඳහා යෙදවීමට අපේක්ෂා කෙරේ.

මෙම හිමිකම් නිකුතුව සඳහා කොටසක් රුපියල් 7.31 බැගින් සාමාන්‍ය කොටස් 116,483,901 ක් අනියුක්ත කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය අනුමැතිය ලබා දී තිබිණි. සාමාන්‍ය කොටස් 106,192,861 ක් සඳහා ඉල්ලුම්පත්‍ර ලැබී තිබුණු අතර, අමතර කොටස් 10,192,621ක් කොටස් හිමියන් විසින් ඉල්ලුම් කර තිබීම සම්පූර්ණ නිකුතුවට අධි දායකත්වයක් ලැබීමට හේතු විය.

නව සාමාන්‍ය කොටස් 2022 දෙසැම්බර් 08 දින කොළඹ කොටස් හුවමාරුවේ දිරි සවි පුවරුවේ ලැයිස්තුගත කරන ලදි.

“පවතින අස්ථාවර වෙළඳපොළ තත්ත්වයන් සලකන විට, මේ ආකාරයට අපගේ කොටස් නිකුතුව පූර්ණ දායකත්වයක් සහිතව අවසන් වීම අපට මහත් සතුටක්. සමාගමේ සමස්ත ප්‍රාග්ධන මට්ටම ශක්තිමත් කරගැනීමටත්, ප්‍රාග්ධන සප්‍රමාණතාව සම්බන්ධ නියාමන සීමාවන්ට අනුකූල වීමටත් මෙමගින් එක්රැස් වූ අරමුදල් භාවිතා කිරීමට අප බලාපොරොත්තු වනවා. කොටස් හිමියන් වෙතින් අඛණ්ඩව අප වෙත ලැබෙන සහයෝගය අප දිරිගන්වන සුලුයි. ඔවුන් වෙනුවෙන් විශ්වාසයෙන් යුතුව දීර්ඝකාලීන වටිනාකම් නිර්මාණය කිරීමට අප කැප වී සිටිනවා.” සොෆ්ට්ලොජික් ෆිනෑන්ස් පීඑල්සී හි වැඩ බලන ප්‍රධාන විධායක නිලධාරිනී ඉවෝන් බ්‍රෝහියර් මහත්මිය පැවසුවා ය.

සොෆ්ට්ලොජික් හෝල්ඩින්ස් පීඑල්සී යනු මෙරට වඩාත්ම පුළුල් හා ඉදිරිගාමී සමූහ ව්‍යාපාර අතරින් එකකි. එය මේ වනවිට තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය, සෞඛ්‍ය සේවාව, පාරිභෝගික වෙළඳාම්, මූල්‍ය සේවා, රථවාහන සහ සංචාරක සේවා ඇතුළු ක්ෂේත්‍ර රාශියක් ආවරණය කරයි.

සොෆ්ට්ලොජික් ෆිනෑන්ස් පීඑල්සී යනු 2011 අංක 42 දරන මුල්‍ය ව්‍යාපාර පනතා යටතේ ලියාපදිංචි මුල්‍ය සමාගමකි. එමෙන්ම එය 2000 අංක 56 දරන කල්බදු මූල්‍යකරණ පනත යටතේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බලපත්‍ර ලබා දී ඇති විශේෂිත ලීසිං සමාගමක් ද වේ.